# වියුක්තනය හා නිර්ධන පුස්තකාල

05 June 2020 16:56

කාල් මාක්ස්ගේ ප්‍රකට සංකල්පයක් වන්නේ නිර්ධනයින් සම්බන්ධව ගත් කල ආත්මය වනාහී "සාරයක් නොමැති ආත්මයක්" බවයි. එනම්, ධනවාදය තුල නිර්ධනයාට හිමි එකම අන්තර්ගතය තම හිස් ආත්මය පමණක් බවයි. මෙම හිස් ආත්මය වනාහි අල්තුසේර් සඳහන් කරන පරිදි "පරිකල්පිත වැරදි-අනන්‍යකරණයක්," නැතහොත් දෘෂ්ටිවාදී පොළාපනීමක් නොවේ. ඊට ප්‍රතිවිරුද්ධව, මෙම හිස් ආත්මය යනු ඩෙකාර්ට්ස් හඳුන්වාදුන් කොගිටෝමය පූර්වාපෙක්ශීභාවයක් (Anticipatory) සහිත ආත්මයයි ("මම සිතමි") - හිස්, සන්තතික තත්වයයි. මෙයට පුද්ගලත්වයක් නොමැත. ඇත්තේ, හිස් ඇතුලාන්තය පමණයි. හිස් යමක් පවතින්නේ කෙසේද? පිළිතුර: ප්‍රථමාරම්භක අවස්ථාවේදී, පැවැත්මට ඇත්තේ හිස්බව නම් ආකෘතියයි. මෙම හිස් ඇතුලාන්තය (ආත්මයේ ශුද්ධ අවස්ථාව) නොමැතිව අචාරධාර්මීය තලයක් හෝ දේශපාලන තලයක් ගැන සිතිය නොහැක. එවිට මාක්ස් කියූ පරිදි මෙම "සාරයක් නොමැති ආත්මයට" ඇත්තේ සෘණාත්මක මානයක් පමණද?

අප සාහිත්‍ය තුලින් උදාහරණයක් ගනිමු. සාහිත්‍ය ඉතිහාසය තුල සැමුවෙල් බෙකට් හඳුන්වනු ලබන්නේ වියුක්තනය හෙවත් අවමවාදය (Minimalism) මගින් තම කලා භාවිතාව තුල නියැළුණු කතුවරයෙකු ලෙසයි. වෙනත් අයුරකින් සඳහන් කරතොත් ඔහු එක්තරා ආකාරයකින් සාහිත්‍ය තුලට වියුක්ත තර්කනය ගෙනෙනු ලැබුවේය. වියුක්ත චිත්‍ර කලාව හෝ නි-ස්වරමය (Atonal) සංගීතය සේම සාහිත්‍ය තුල විශාල ආඛ්‍යාන, චරිත, කතා, සිද්ධි වලින් මිදී, කතුවරයාට සාහිත්‍ය තුල ලකුණු කල හැකි මිනිස් ජීවිතයේ අවම හා ශුද්ධ සීමාව ලකුණු කිරීම බෙකට් අතින් සිදු විය. අන් බොහෝ කතුවරුන්ට වෙනස්ව ඔහුගේ නවකතාවල (විශේෂයෙන්ම ඔහුගේ ට්‍රයෝලොජී නවකතා ත්‍රිත්වය තුල) යම් අවම ආඛ්‍යානයක (එක් චරිතයක්, එක අවකාශයක්, එක සිද්දියක් පමණක් - පළමු නවකතාව තුල - Molloy ) සිට කිසිදු ආඛ්‍යානයක් නොමැති, නොනවත්වා ඇදෙන හඬක්/කථනයක් (තුන්වන නවකතාව - Unnamable) පමණක් බවට මුළු නවකතාවම පත්වේ. එනයින්, ලේඛකයෙකු යා හැකි උපරිම දුර ගද්‍ය රචනාවක් තුල යාමයි. ඔහුගේම Not I නම් නාට්‍ය යනු නොනවත්වා ඇදෙන මුඛයක් හා හඬක් පමණක් (ආඛ්‍යානයක් නොමැති) වේදිකාව උඩ පෙන්වීමයි. නාට්‍ය එපමනියි. බොහෝ ප්‍රේක්ෂකයන් තෘෂ්නිම්භූතවී නාට්‍ය මැදදීම නැගිට යයි. බෙකට් වැනි ලේඛකයන් යනු අවට යතාර්ථය නිරූපණය කරන අය නොවේ. මිනිස් පැවැත්මේ ඇති වියුක්ත වස්තු හේතුව, අවම න්‍යෂ්ටිය, කලාවේ ආකෘතියෙන් විදහාපාමයි. මෙම හිස් ඇතුලාන්තය (නොනවත්වා ඇදෙන මුඛය හා හඬ) යනු අපගේ ශුද්ධ පැවැත්මයි. එබැවින් එහි ස්වභාවය අචාරධාර්මීයයි. තවද, මිනිස් නිදහස සඳහා අවසථාවක් ලැබෙන්නේද මෙම හිස්, සාරයක් නැති ආත්මය හරහාමය.

කියවීම, දේශපාලනයේදී වැදගත් ආත්මීය පරිවර්තනයක් සිදු කරයි. ඒ, කියවීමද යම් වියුක්ත ක්‍රියාවක් නිසාවෙනි. වෝල්ටර් බෙන්ජමින්ගේ යුගයේදී පොත්වලට හා පුස්තකාලවලට තිබූ තත්වය අද වෙනස්ය. බෙන්ජමින්ට අනුව පොත් එක්රැස් කිරීම හා පුස්තකාලයක් නඩත්තු කිරීම එකතරා ආකාරයක පාරභෞතික මානයක් සහිත ක්‍රියාවකි. ඒවා සමග නොයෙක් මතකයන් රැඳී තිබේ. නමුත් අපගේ යුගයේදී ප්‍රකාශන කර්මාන්තය එක්තරා ආකාරයකින් පොත් වලින් විනෝද වන ආකාරය උගන්වන අතර, අනෙක් පසෙන් හරයාත්මක හා න්‍යායාත්මක පොත් ලබා ගැනීම ඉතා අපහසු කර ඇත. Amazon හරහා ඒවා ලංකාවට ගෙන්වා ගැනීම ඉතා මිල අධික කටයුත්තකි. නමුත් බුද්ධිමය දේපල නීති කඩ කරමින් බොහෝ පොත් අන් කිසිදාකට වඩා දැන් අපට අන්තර්ජාලය හරහා ලබා ගත හැක. නමුත් ගැටලුව මෙයයි: බැරිවෙලාවක්වත් අපෙන් යම් අදහසක් විමසීම සඳහා මාධ්‍යකින් අපගේ නිවසට පැමිණියහොත්, තම අදහස ඉදිරිපත් කරන අතරතුර පසුතලයේ තැබීමට පුස්තකාලයක් සොයාගන්නේ කෙසේද යන්නයි. වෙනත් අයුරකින් සඳහන් කළහොත්, දෘඪ පිටපත් සහිත පුස්තකාලයක් වෙනුවෙන් කාංසාවෙන් සිටීම සාධාරණීකරණය කල හැකි දෙයක්ද

වෙනුවෙන් කාංසාවෙන් සිටීම සාධාරණීකරණය කල හැකි දෙයක්ද?

මෑතකදී ස්ලාවෝ ජිජැක් විසින් කොවිඩ් සමය තුල ඇතිවී ඇති ලිංගික සංස්කෘතිය ගැන වැදගත් අදහසක් ප්‍රකාශ කරන්නට විය. අපටද දැනගන්නට ලැබී ඇති පරිදි සියලු දෙනා ගෙවල් තුලට කොටුවී ඇති සමයක, සීමාවූ ලිංගික ක්‍රියාවලට පිළියමක් ලෙස අන්තර්ජාලය තුලින් ලිංගික ක්‍රියා වලට බොහෝ අය ඇබ්බැහිවූ බවයි. නිල් චිත්‍රපට වල සිට සජීවී තත්‍යසමාන ලිංගික දර්ශන හා රංගන දක්වා, ලිංගිකත්වය තිරයක් ඉදිරිපිට කරනු ලබන බෙලහීන ක්‍රියාවක් බවට ලඝු විය. ජිජැක් මෙය විචාරය කරමින් අවධාරණය කර සිටියේ ශරීර දෙකක් සම්බන්ද වන ලිංගික ක්‍රියාවක ඇති අධ්‍යාත්මික ගුණයයි. එනම්, මිනිස් ලිංගිකත්වයේ අධ්‍යාත්මික මානය ඇත්තේ ශරීර දෙකක් අතර වන ලිංගික සම්බන්ධය කෙසේ හෝ ජීවවිද්‍යාත්මක තලය ඉක්මවා, එය කිසිදු උපයෝගීතාවයකින් තොරව ඇති, කාමය සඳහා පමණක් වන ක්‍රියාවක් නිසාවෙන්ය. ඒ අනුව ආදරය ඇත්තේද ශරීරයෙන් පිට නොව, ශරීරය තුල ඇති අධ්‍යාත්මක මානය තුලය. දැන් අපි මෙම ප්‍රවාදය ඉහත පුස්තකාලය උදෙසා යොදමු: කියවීම තුල ඇති සත්‍ය අධ්‍යාත්මික මානය ඇත්තේ ඇත්ත පොත් තුලද? දෘඩ පිටපත් සහිත පුස්තකාල තුලද? පරිඝනකය හෝ ජංගම දුරකථනය තුලින් කියවීමෙන් ඉහත අධ්‍යාත්මික මානය, තත්‍යසමාන ලිංගික ක්‍රියාවක්සේ මග හැරේද?

මොයිෂ් පොස්ටෝනේ නම් මාක්ස්වාදී ඉතිහාසඥයා සඳහන් කරන ලද්දේ ධනවාදයේ ඇති සමාජ සබඳතාවල මුඛ්‍ය තර්කණය නම් එහි ඇති වියුක්ත ආධිපත්‍ය (Abstract Domination) බවයි. එනම්, අප සිතන පරිදි එක් එක් පුද්ගලයන්, සමාජ තීරු, සුවිශේෂ ජාතීන්, ධනපතියන්, අප මතට ආධිපත්‍යක් මුදා හරිනු වෙනුවට, ක්‍රමය විසින් පාරිභෝගික භාණ්ඩ නම් සමාජ බන්දනය හරහා අපට අත්නොදකින වියුක්ත ආධිපත්‍යක් මුදා හරින බවයි. මා සිතන පරිදි මෙහි විලෝමයද අප වටහා ගත යුතුයි. එනම්, වියුක්ත ආධිපත්‍ය හරහා වියුක්තනයම යම් අධිපතිධාරිත්වයක් (Dominating Abstraction) මුදා හරින බවයි. එනම් අප ජීවිතය පහසු කර ඇති, මිදිය නොහැකි, ඵලදායක වියුක්තනයන් යනුම එකතරා ආකාරයක ආධිපත්‍ය නම් මූලධර්මයට අයත්, එහි තර්කනයේම දිගුවක් බවයි. උදාහරණයක් ලෙස, තව දුරටත් දෘඩ පිටපත් සහිත පොත් අපට උවමනා නොවන්නා සේම, පරිඝනකය හරහා එම පොත් වලම මෘදු පිටපත් කියවිය හැකි වීම යනු නිර්ධන අපට මහත් පහසුවකි. වෙනදා ලබා ගත නොහැකි වූ බොහෝ පොත් අපට ලේසියෙන් ලබා ගෙන කියවන්නට අවස්ථාව උදාවී ඇත. එහෙත්, ධනවාදයේ දෘෂ්ඨිකෝනයෙන් මෙම වියුක්තනය (දෘඩ පිටපත් සහිත පොත් අවශ්‍ය නොවීම), අපගේ සමාජ ජීවිතයේ නිශ්චිත සාරයක් ඉවත් කිරීමකි. එනයින්, එය ආධිපත්‍යකි. මේ අනුව නිර්ධනයාට පුස්තකාලයක් අකැපද?

දැන් අප ඉහත ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට උත්සහ කරමු. ප්‍රථමයෙන්, පෙර සඳහන් කළ පරිදිම, බෙන්ජමින්ගේ අවධිය මෙන් නොව අප ජීවත්වන ධනවාදී සමාජය තුල බොහෝ සාරයන් වියුක්තනය කර ඇත. අප මෙහිදී විභාග කළේ මෙය කියවීමට අදාළ වන ආකාරයයි. බෙකට් ඔස්සේ මා පැහැදිලි කිරීමට උත්සාහ කළේ මෙම වියුක්තනයම අපේ නිදහසට මග පාදන බවයි. එනම්, සියලු සාරයන් (බොහෝ විට ඓන්ද්‍රීය සංස්කෘතිකමය දේවල්) ඉවත් කල පසු ඉතිරි වන හිස් ආත්මය වනාහී මිනිසාගේ රැඩිකල් අතුලාන්තයයි. මේ හරහා නොයා, නැතහොත් අවමානය (Disgrace - මෙම පොත සිංහලට පරිවර්තනය කොට ඇත) නම් නවකතාවේ මහාචාර්යවරයාගේ ආස්ථානය මෙන් බල්ලකු නොවී, සියලු අනන්‍යතාවලින් ඉවත් නොවී, නිදහස කෙරෙහි යා නොහැක. එබැවින්, නිර්ධනයා (අනන්‍යතාවයක් නොමැති - හිස්) මෘදු පිටපත් සහිත පුස්තකාලවලට බිය විය යුතු නැත. පියරේ බයාඩ් දැක්වූ පරිදි පොතක වියුක්ත මානය යනු එහි දෘඩ පිටපත නොව එහි තත්‍යසමාන අන්තර්ගතයයි. සත්‍ය පරිදි, පොතක ඇති මෙම තත්‍යසමාන අන්තර්ගතය තම හිස් ඇතුලාන්තය සමග ගැටී ඇත්නම් එම පොත ඔබට අමතක වුවාටද කමක් නැත. ඒවාට බයාඩ් කියනුයේ "කියවා අමතකවූ පොත්" කියාය. එම නිසා නිර්ධනයාගේ පුස්තකාල යනු තත්‍යසමාන ඒවායි.

කියවීමෙහි ඵලය වන ඉහත දැක්වූ තත්‍යසමාන පුස්තකාලය යනු ඍජුව සාමුහිකත්වය (Commons) හඟවන තලයකි. Cloud Storage එකක් සිහියට නගන්න. බොහෝවිට අපට දෘඩ පුස්තකාලයක් පමණක් නොව සියල්ල එක තැනක ගබඩා ගත කළ හැකි පරිඝනකයක්ද නොතිබිය හැක. ඉතුරු වන්නේ සම්පූර්ණ තත්ත්‍යසමාන Cloud එකක් වුවද විය හැක. විවිධ ඵකියා වලට මාරු වෙමින්, රටවල් අතර ශ්‍රමය සඳහා මාරු වන එඬේර ගණයේ නූතන නිර්ධනයාට ගෙයක තැන්පත් කර තැබිය හැකි දෘඩ පිටපත් සහිත පුස්තකාල යනු විහිලුවකි. සමහර පොත් අමතකවූ ප්‍රාදේශීය පුස්තකාලයක කියවා දැන් අමතකව ඇති ඒවා විය හැක. සමහර පොත් අපගේම සගයන් අතර බෙදා දී ඔවුන් අපට නොදුන් ඒවාය. සමහර පොත් Audio Books ය. මේ සියලු පොත් සහිත තත්‍යසමාන නිර්ධන පුස්තකාලයේ සංවිධිත රීතිය වන්නේ යම් කාල්පනික ප්‍රශ්නයකි. පුස්තකාලය යනු හිස් ආත්මය තමන් සමග ගැටුනු යම් ප්‍රශ්නයක බාහිර තත්‍යසමාන ප්‍රකාශමානිතයයි. මෙම තේරුම් ගැනීම අනුව, දෘඩ පිටපතක් සහිත පොතක් යනුද එකතරා ආකාරයක තත්‍යසමාන මෘදු පිටපතකි. අප Cloud පුස්තකාලය බිය නැතුව බාර ගත යුතුව ඇත්තේ, නූතන ධනවාදයේ වියුක්තනය තුල අපට ඉතුරු වන මෙම තත්‍යස්මාන හිස් අඩවිය යනු අද දිනයේ පන්ති අරගලයේ අඩවිය බැවිනි. එබැවින් එය සාමුහිකත්වය හඟවයි.

අද දිනයේ විශාල පොත් රාක්ක පිටුපස තබා බොරු කියන මිනිසුන් නිර්ධනයන් නොව ධනපතියන්ය. පුස්තකාලය යනු අඳුරු යතාර්ථය තුලට එකෙන් එක ඉටි පන්දම් පත්තු කරමින් එලිය ගෙන දෙන ආලෝකය නොවේ. නිර්ධන පුස්තකාලයේ නිවැරදි විචාරක කර්තව්‍ය වනුයේ දෘෂ්ඨිවාදාත්මක අධි බලැති විදුළි බුබුළු එකින් එක නිවා දමා අවශ්‍ය බුබුළු පමණක් සමග අභිමුඛ වීමේ හැකියාවයි (They Live චිත්‍රපටයේ මෙන්). පුස්තකාලය විසින් නියම තාර්කික හා න්‍යායාත්මක සතුරා තොරා ගැනීමට සලස්වයි. මේ අනුව දේශපාලනයේ එක් වැදගත් මානයක් වනුයේ බෙන්ජමින් පැවසූ පරිදි ඉතිහාසය අධික වේගයෙන් ධාවනය කිරීම නොව, වහාම එහි හදිසි තිරිංග ක්‍රියාත්මක කිරීමයි. අපගේ නිර්ධන තත්‍යසමාන පුස්තකාලය උදව් වන්නේ මෙම තිරිංග ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ හිස් ආත්මීයත්වය සමග සම්බන්ධවී ආචාරධර්මීය නැවතුමක් ජනනය කිරීමටයි. එවිට දෘඩ පොත් යනු අර්චනකාමයකි.